ඔබ කිසිවකු මරණය ප්රිය නොකළ යුතුය. දැහැමියෙකු නම් අධික කර ගන්නට පුළුවන, නපුරෙකු නම් පාප ක්ෂමා අයැද සිටින්නට පුළුවන.

නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- පැවසූ බව අබූ
හුරෙයිරා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “ඔබ කිසිවකු මරණය ප්රිය නොකළ යුතුය. දැහැමියෙකු නම් අධික කර ගන්නට පුළුවන, නපුරෙකු නම් පාප ක්ෂමා අයැද සිටින්නට පුළුවන.“ මෙම පද පෙළ ඉමාම් බුහාරි තුමාගේය. අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- ප්රකාශ කොට අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- විසින් වාර්තා කළ මුස්ලිම් හි සඳහන් වාර්තාවක, “ඔබ කිසිවකු මරණය ප්රිය නොකළ යුතුය. එය පැමිණීමට පෙර එය පැතිය නොයුතුය. නියත වශයෙන්ම ඔහු මරණයට පත්වූ විට ඔහුගේ ක්රියාකාරකම් විසන්ධි වී යනු ඇත. තවද නියත වශයෙන්ම මුඃමින්වරයාගේ ආයුෂ යහපතට මිස
අධික නොවන්නේය.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

“ඔබ කිසිවකු මරණය ප්රිය නොකළ යුතුය.“ යන -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගේ ප්රකාශ වනාහි, මෙය තහනම් නියෝගයකි. හේතුව යමෙකු මරණය ආශා කිරීම යනු අල්ලාහ්ගේ තීන්දුව පිළිනොගන්නා කරුණකිි. තමන්ට යම් පීඩාවක් ඇති වූ විට මුඃමින්වරයා ඒ කෙරෙහි ඉවසීමෙන් සිටීම අනිවාර්යය. එම පීඩාවන් ඉවසා දරා ගන්නේ නම් වැදගත් කරුණු දෙකක් ඔහු ලබනු ඇත. පළමුව, තම පාපයන්ට සමාව හිමිවේ. මිනිසෙකුට යම් දුකක් දුෂ්කරත්වයක්, පීඩාවක් හෝ යම් අනතුරක් සිදුවනුයේ එමගින් අල්ලාහ් ඔහුගේ පාපයන් කමා කිරීමට මිස නැත. යම් කටුවක් ඇණුනද නියත වශයෙන්ම එමගින් ඔහුගේ පාපයන් කමා කරනු ඇත. දෙවනුව, අල්ලාහ්ගෙන් වූ කුලිය බලාපොරොත්තුවෙන් ඉවසා සිටින්නේ නම් එය අල්ලාහ් වෙනුවෙන්ම වූයේ නම්, සැබැවින්ම ඔහුට කුසල් පිරිනමනු ලබනු ඇත. ඔහු මරණයට ප්රිය කිරීම යනු අල්ලාහ්ගේ තීන්දුව කෙරෙහි ඉවසීමක් නොමැති බවත් ඔහු එය පිළිනොගන්නා බවත් පෙන්වා දෙන්නකි. අල්ලාහ්ගේ දූතයාණෝ මෙසේ විස්තර කළහ. ඔහු දැහැමියන් අතුරින් කෙනෙකු වන්නේ නම්, ඔහුගේ ජීවිතයේ ඉතිරිව ඇති කාලයේ දැහැමි ක්රියාවන් සිදු කිරීම අධික කර ගනු ඇත. මුඃමින්වරයා ජීවත්ව සිටියදී යම් පීඩාවක් හෝ යම් දුෂ්කරතාවක් මත සිටින්නේ නම් ඇතැම් විට ඔහු සතු කුසල් ඔහුට අධික වනු ඇත. ඔහු නපුරෙකු වී නපුරුකම් කර ඇත්නම්, එ් සඳහා පාපක්ෂමාව අයැද සිටිය හැක. එනම් අල්ලාහ්ගෙන් පශ්චාත්තාපය පැතීමය. එනම් තමන් පිළිගන්නා ලෙසත් නිදහසට කරුණු පිළිගන්නා ලෙසත් අයැද සිටීමය. පසුව ඔහු මිය යැදුණේ නම් ඔහුගේ පාපයන්ට සමාව ලබනු ඇත. එහෙයින් ඔබ මරණයට ආශා නොකරන්න. හේතුව සියලු කරුණු තීන්දු කරනු ලැබූ දෑ වෙති. එහෙයින් ඉවසා සිටිය යුතුය. කුසල් බලාපොරොත්තු විය යුතුය. සියලු තත්වයන් අඛණ්ඩව පවතිනුයේ එහි ස්ථානයන් සිටය. මරණයට ආශා කිරීමෙන් හා එය පැතීමෙන් තහනම් කර ඇත්තේ මරණය තුළින් සියලු ක්රියාකාරකම් විසන්ධි වී යනු ඇතැයි යන අර්ථයෙන් බව මෙහි පෙන්වා දී ඇත. එසේ නම් ජීවත් වීම දැහැමි ක්රියා සිදු කිරීමට හේතුවක් වෙයි. දැහැමි ලෙස ක්රියා කිරීම හේතුවෙන් කුසල් අධික වෙයි. ජීවත්ව සිටියදී අල්ලාහ්ව ඒකීයත්වයට පත් කරමින් සිටීම උතුම් ක්රියාවකි.මේ තත්ත්වය මත දේව විශ්වාසයේ සැකයක් ඇති වීමට අවස්ථාවක් නැතැයි අපේක්ෂා නොකෙරෙයි. අල්ලාහ් අප ආරක්ෂා කරත්වා! හේතුව එසේ සිදුවීම සුලබය.දේව විශ්වාසය හදවත සමග මුසු වූ පසුව කිසිවකු එය විසන්ධි නොකරනු ඇත. එසේ සිදුවනුයේ ඉරණම අනුවය. ඇතැම් විට සිදුවන්නට

පුළුවන නමුත් එය සුලබය.කවරෙකුට නපුරු අවසානයන් අල්ලාහ්ගේ ඥානය තුළ පවතින්නේ ද ඔහුගේ ආයුෂ වැඩි වුව ද අඩු වුව ද ඉන් ඵලක් නොවන්නේය. මරණය ප්රමාද කරන මෙන් ඉල්ලා සිටිය ද එහි යහපත් ඔහුට නොවනු ඇත. මෙම හදීසයේ දැහැමියා දැහැමි ක්රියාවන් සමග බැඳී සිටිය යුතු බවටත් නපුරා තම නපුරු ක්රියාවන් පිළිබඳ අවවාදයෙන් සිටිය යුතු බවටත් පෙන්වා දෙයි. එය මෙසේ පවසන්නාක් මෙනි: කවරෙකු දැහැමියකු වන්නේ ද මරණයට ආශා කිරීම අතහැර දැමිය යුතුය. ඔහු තම දැහැමි කටයුතුවල නිරතව සිටිය යුතුය. ඒවා අධිකව කළ යුතුය. කවරෙකු නපුරෙකු වන්නේ ද ඔහුද මරණය ආශා කිරීම අතහැර දැමිය යුතුය. තමන්ගේ නපුරු ක්රියාවන් සමඟම මරණයට පත් නොවනු පිණිස නපුරු ක්රියාවන්ගෙන් ඔහු ඉවත් විය යුතුය එසේ නොවේ නම්, ඔහු වරදක් සිදු කර ගනු ඇත.

http://sunnah.global/hadeeth/si/show/5652